දිනය: 2026.02.19

## මාධ්‍ය නිවේදනය

## එල්.පී. ගෑස් සැපයුම සම්බන්ධයෙන් පාරිභෝගිකයන් වෙත කෙරෙන විශේෂ දැනුම්දීම.

වෙළඳපොළේ පවතින එල්.පී. ගෑස් (LP Gas) සැපයුම සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මහජනතාව වෙත මෙම විශේෂ පැහැදිලි කිරීම සිදු කරනු ලබයි. මෙරට ගෑස් අවශ්‍යතාවයෙන් වැඩිපුර කොටසක් සපයන ප්‍රධාන ගෑස් සැපයුම්කරු වන ලිට්‍රෝ ගෑස් සමාගමේ සැපයුම් කටයුතු කිසිදු බාධාවකින් තොරව සිදුවන අතර, වෙළඳපොළ ඉල්ලුමට සරිලන පරිදි ගෑස් තොග අඛණ්ඩව නිකුත් කරමින් පවතින බව තහවුරු කරමු. අනෙකුත් ගෑස් සැපයුම්කරුවන්ගේ පද්ධතිය තුළ පවතින තාවකාලික සැපයුම් ගැටලුවක් හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල බෙදාහැරීමේ කටයුතු වල සුළු ප්‍රමාදයන් වාර්තා වී ඇත. ගෑස් සැපයුම ස්ථාවරව පවතින බවත් ගෑස් සැපයුම පිළිබඳ අනවශ්‍ය බියක් ඇති කර ගනිමින් අතිරික්ත ලෙස ගෑස් තොග රැස් කිරීමට උත්සාහ නොකරන ලෙස අපි කාරුණිකව දැනුම් දෙන්නෙමු. පාරිභෝගිකයන් එකවර විශාල වශයෙන් ගෑස් මිලදී ගැනීමට උත්සාහ කිරීම තුළින් වෙළඳපොළේ ''කෘත්‍රිම හිඟයක්'' නිර්මාණය විය හැකි බව අවධාරණය කරමු. වර්ථමාන සමාජය තුල ඇති වී තිබෙන ගෑස් හිගය පිළිබඳව වගකීම් සහිතව කටයුතු කරන ලෙසත් අනවශ්‍යය ලෙස තොග රැස් කිරීමෙන් වලකින ලෙසත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මහජනතාවට දැනුම් දෙන්නෙමු.

ගෑස් තොග පවතිද්දී ඒවා සඟවා තබන හෝ පාරිභෝගිකයන් අපහසුතාවයට පත් කරමින් වැඩි මිලට අලෙවි කරන නියෝජිතයන් සොයා දිවයින පුරා වැටලීම් දැඩි කරන ලෙස සියලුම දිස්ත්‍රික් නිලධාරීන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා විසින් උපදෙස් ලබා දී ඇත. එවැනි අක්‍රමිකතා සිදුකරන වෙළෙඳුන්ට එරෙහිව තරාතිරම නොබලා නීතිය දැඩිව ක්‍රියාත්මක කරන බවටත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙමගින් වෙළඳුන්ට දැනුම් දෙනවා.පවතින තත්ත්වය පිළිබඳව අනවශ්‍ය කලබලයකින් තොරව, ඔබේ එදිනෙදා අවශ්‍යතාවයට පමණක් ගෑස් මිලදී ගැනීමට කටයුතු කරන ලෙසත්, මෙම තත්ත්වය කෙටි කාලීන වන අතර එය සමස්ත ගෑස් හිඟයක් ලෙස අර්ථ නිරූපණය නොකරන ලෙස පාරිභෝගිකයන්ගෙන් ඉල්ලා සිටිමු. සෙසු ගෑස් සමාගම් වල සුලු වශයෙන් පවතින සැපයුම් ප්‍රමාදය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය මැදිහත්වීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන බවත් සහතික කරමු.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.**